**ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**(අ) ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ රු.30,319ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ වෙනත් ලැබීම රු.30,318.51 ක් වැරදීමකින් අඩුවෙන් සටහන් කර ඇත. | නිවැරදි වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වේ. |

**(ආ) පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් ගෙවීම් රු.19,476,169 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.19,453,489 ක් ලෙස දැක්වීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය රු.22,680 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ සටහන් විය යුතු නමුත් සිදු වූ අතපසුවීමකින් එසේ සටහන් නොවීම නිසා මුදල් ප්‍රවාහය රු.22,680 කින් අඩුවෙන් දක්වන ලදී. | නිවැරදි වටිනාකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම් වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් රු.58,468 ක බැරකම් පිළිබඳ විස්තර භාණ්ඩාගාරයට විධිමත්ව වාර්තා කර නොතිබුණි. | අතපසුවීමකින් සිදු වූ මෙම දෝෂ ඉදිරියට සිදු නොවීමට කටයුතු කරන බව දන්වමි. | සියලුම බැරකම් පිළිබඳ විස්තර භාණ්ඩාගාරයට විධිමත්ව වාර්තා කළ යුතු වේ. |

### 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළයුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පනතේ 38 (ඊ) වගන්තිය අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත තර නොමැති අතර, අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (ඊ) වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 135 (4) | මූල්‍ය බලතල පැවරීම නිසි පරිදි යාවත්කාලීනව සිදුකර නොතිබුණි. | රාජකාරියට නොපැමිණීම ආවරණය කිරීමට විධිවිධාන දක්වා 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය බලතල පවරාදීමේ උපලේඛනය සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති. | මුදල් රෙගුලාසි 135 (4) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වර්ෂයේ සිට මේ දක්වා මිලදී ගනු ලැබූ මූල්‍ය නොවන වත්කම් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොමැත. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස අදාල විෂය භාර නිලධාරියා දැනුවත් කරන ලදි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යය නිම කළ විගසම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම පියවිය යුතු වුවද එකතුව රු.40,000 ක අත්තිකාරම් 3 ක් දින 70 සිට දින 338 දක්වා ප්‍රමාද කර පියවා තිබුණි. | 2020.10.09 දින ලබා දෙන ලද රු.20,000.00ක අත්තිකාරම 2020.12.18 දින පියවා ඇති අතර කෝවිඩ් 19 වෛරසය හේතුවෙන් රටතුළ පැවති තත්වය හේතුවෙන් 2020 නොවැම්බර් මාසය තුළ දෙපාර්තමේන්තු කටයුතු තාවකාලිකව නවතා තැබීම හේතුවෙන් එම අත්තිකාරම පියවීමට අදාළ කටයුතු සිදු කිරීමට ප්‍රමාද වී ඇත. | නියමිත පරිදි ලබාගත් තත්කාර්ය අග්‍රිම පියවිය යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිශ්චල දේපල මත ලබාගත් ණය ගනුදෙනු වලින් පීඩාවට පත් වූවන්ට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩ පිළිවෙලක් සැකසීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේම මේ පිළිබඳව මහජනයා දැනුවත් කිරීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් සකස් කර හෝ නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවෙන් සිදුවන සේවාව වඩාත් පුළුල් කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂය තුළ ගම්පහ, ගාල්ල කුරුණෑගල සහ කොළඹ යන නගර කේන්ද්‍රකරගනිමින් ශාඛා මණ්ඩල 04ක් ස්ථාපිත කිරීමට නියමිතව තිබූ අතර කෝවිඩ් 19 වෛරසය හේතුවෙන් ශාඛා මණ්ඩල පිහිටුවීමේ කටයුතු සිදු කිරීමට නොහැකි විය. නමුත් 2021 වර්ෂයේදී එම ශාඛා මණ්ඩල පිහිටුවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ ලෙස නිශ්චල දේපල මත ණය වූවන්ගේ ණය බරින් නිදහස් වීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් සකස් කල යුතුය. |

## 3.2 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම දෝෂ සහිතව සිදු කර ඇත්තේ සිදු වූ අතපසුවීමකිනි. මින් ඉදිරියට මෙම දෝෂය නිවැරදි කරගනිමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිලෙ කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 3.3 කාර්ය භාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ ලියාපදිංචි නඩු 1301 න් 507 ක් නිම කිරීමට සැලසුම් කල ද නඩු 222 ක් පමණක් විසඳා තිබුණි. | කෝවිඩ් 19 වෛරසය හේතුවෙන් රටතුළ පැවති තත්ත්වය නිසා ණය සහනදායක මණ්ඩලයේ විමසීම් කටයුතු අඛණ්ඩව සිදු නොවූ අතර, වර්ෂය තුළ විසඳන ලබන ඉල්ලුම්පත් සංඛ්‍යාව අඩු වීමට එය හේතුවක් විය. නමුත් 2021 වර්ෂය තුල ශාඛා මණ්ඩල පිහිටුවීමට කටයුතු සිදු කරමින් පවතින බැවින් 2021 වර්ෂය තුළ විසඳන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව වර්ධනය කර ගැනීමට අපේක්ෂා කරන බව දන්වමි. | දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කල යුතු වේ. |

**3.4** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තු කටයුතු කළමනාකරණය කර ගැනීමට නොහැකි වීම නිසා සිදු වූ ප්‍රමාද දෝෂය හේතුවෙන් 2019 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව පිළියෙල කර මේ වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි විය. මේ වන විට 2019 වර්ෂයේ කාර්යසාධන වාර්තාව මුද්‍රණ මට්ටමේ පවතින බව කාරුණිකව දන්වා සිටිමි | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**3.5** **ප්‍රසම්පාදන**

------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොවූ රු.105,840 ක වටිනා ෆැක්ස් යන්ත්‍ර 04 ක් මිලදී ගෙන තිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි | මිලදී ගැනීම් හැකිතාක් ප්‍රසම්පාදන සැලැස්මට අනුකූල විය යුතු වේ. |
| **(ආ)** ප්‍රසම්පාදන සැලැස්මට අනුව ලැප්ටොප් පරිගණක මිලට ගැනීමට රු.450,000 ක් ඇස්තමේන්තු කර තිබුණ ද ඒ සඳහා රු. 900,188 ක් වැය කර තිබුණි | ලැප්ටොප් පරිගණක මිලට ගැනීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මේ රු.450,000ක් පමණක් වුවද පැවති අවශ්‍යතාවය මත ඒ සඳහා රු900,188 ක් වැය කරන ලදි. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතු වේ. |

## 3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන් 05 දෙනෙකුගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි | එම නිලධාරීන්ගේ ඇප තැබීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව කටයුතු කල යුතුවේ. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශාඛා මණ්ඩල පිහිටුවීමට ප්‍රතිපාදන ලැබී නොතිබුණ ද ඒ සඳහා රු.1,174,028 ක් වැයකර ලැප්ටොප් 5 ක් මුද්‍රණ යන්ත්‍ර 7 ක් හා ෆැක්ස් යන්ත්‍ර 4 ක් මිල දී ගෙන තිබුණු අතර 2021 ජුලි 31 දින වන විටද එම ශාඛා පිහිටුවා නොතිබීම හේතුවෙන් එම උපකරණ නිශ්ක්‍රීයව පැවතුණි. | ණය සහනදායක මණ්ඩලයේ ශාඛා මණ්ඩල පිහිටුවීම 2020 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබූ නමුත්, 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ අතුරු සම්මත ගිණුම් වලට අනුව, ශාඛා මණ්ඩල සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිළදී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කළද, ශාඛා මණ්ඩල පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබී නොතිබුණි. තවද කෝවිඩ් 19 වෛරසය හේතුවෙන් රටතුළ පැවති තත්වය මත අපේක්ෂා කළ පරිදි ශාඛා මණ්ඩල පිහිටුවීමට නොහැකි විය. ශාඛා මණ්ඩල කඩිනමින් පිහිටුවීම අත්‍යාවශ්‍ය වන බැවින් 2020 වර්ෂයේ පවතින ප්‍රතිපාදන යටතේ ශාඛා මණ්ඩල සඳහා ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මිළදී ගැනීම සිදු කරන ලදි. 2021 මැයි මස වන විට ශාඛා මණ්ඩල පිහිටුවීමට අපේක්ෂා කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. | ප්‍රතිපාදන සැලසුම්ගත කාර්යයන් සඳහා යෙදවිය යුතු වේ. |

**4. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාරය හා සම්බන්ධවන උනන්දුවක් දක්වන පර්ශවයන් හඳුනාගෙන තිබුණද, එම පර්ශවයන් වෙත දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවෙන් සිදුවන සේවාව වඩාත් පුළුල් කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂය තුළ ගම්පහ, ගාල්ල කුරුණෑගල සහ කොළඹ යන නගර කේන්ද්‍රකරගනිමින් ශාඛා මණ්ඩල 04ක් ස්ථාපිත කිරීමට නියමිතව තිබූ අතර කෝවිඩ් 19 වෛරසය හේතුවෙන් ශාඛා මණ්ඩල පිහිටුවීමේ කටයුතු සිදු කිරීමට නොහැකි විය. නමුත් 2021 වර්ෂයේදී එම ශාඛා මණ්ඩල පිහිටුවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව වැඩිදුරටත් දන්වා සිටිමි. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා උනන්දුවක් දක්වන පර්ශවයන් හඳුනාගෙන දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු වේ. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2020 වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත තර නොමැති අතර, අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 6. මානව සම්පත් කළමණාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තාත්වික සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ද්විතීයික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු 08 ක් පැවතුණි. | මෙම දෙපාර්තමේන්තුවේ අංක 3/1/6 හා 2019.11.27 දිනැතිව පවතින පුරප්පාඩු සම්පූර්ණ කර දෙන මෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීමක් කර ඇතත් මේ වන විටත් පිළිතුරු ලැබී නොමැත.<br><br>දෙපාර්තමේන්තුවේ 3/1/14 හා 2021.03.15 දිනැතිව කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු සහ රියදුරු තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යක්ෂ, බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය වෙත ඉල්ලීම් ලිපි යවා ඇත. | අත්‍යවශ්‍යම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2018 සිට මේ දක්වා මෙම මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොමැති අතර, 2021 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |